(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 95. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 සැප්තැම්බර් 22 බදාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු ටිරාන් අලස් මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු එච්. එම්. එම්. හරීස් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1.ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ: ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—**

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2021 සැප්තැම්බර් මස 15 වන දින

ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

ගෝඨාභය රාජපක්ෂ

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 සැප්තැම්බර් 21 දින ම'විසින් 'ශ්‍රී ලංකා සුරකුම්පත් සහ විනිමය කොමිෂන් සභා' යන පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

II

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන සහ 2021 සැප්තැම්බර් 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සේවය කිරීම පිණිස, මතු සඳහන් මන්ත්‍රීවරයන්ද පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

ගරු රවුෆ් හකීම් මහතා"

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කම්කරු අමාත්‍යවරයා විසින් 2015 සහ 2017 වර්ෂ සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තා හා ගිණුම් ඉදිරිපත් කර එම වාර්තා, කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

(2) වෙළඳ අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 2017 වර්ෂය සඳහා ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල වාර්ෂික වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු සී.බී. රත්නායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥා පනතේ 22අ වගන්තිය යටතේ නියෝග;

(ii) 2017 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2018 වර්ෂය සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) උකුවෙල, බෝවත්ත, අංක 46/ඒ දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. පුංචිමැණිකේ මහත්මියගෙන් ලැබුණු 2021.07.12 දිනැති පෙත්සම ගරු රෝහණ දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) මහරගම, නාවින්න, පතිරගොඩ පාර, ශ්‍රී රත්නපාල මාවත, අංක 188/13 දරන ස්ථානයෙහි පදිංචි මහාචාර්ය අමල් පරාක්‍රම රාජපක්ෂ මහතාගෙන් ලැබුණු 2021.04.14 දිනැති පෙත්සම; සහ

(ii) රජවැල්ල, නිතුලේමඩ, අංක 33 දරන ස්ථානයෙහි පදිංචි ධර්මලිංගම් ශෂි කුමාර් මහතාගෙන් ලැබුණු 2020.12.21 දිනැති පෙත්සම

ගරු අශෝක් අබේසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) වැලඩ, තෝරාන පාර, අංක 101/1/බී දරන ස්ථානයෙහි පදිංචි බී. බී. ජී. ප්‍රේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2021.07.16 දිනැති පෙත්සම; සහ

(ii) අලව්ව, පහළ වළකුඹුර, අංක 312/3 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එච්. ගාමිණී හේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු 2021.04.23 දිනැති පෙත්සම

ගරු අසංක නවරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 ඔක්තෝබර් 04 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 ඔක්තෝබර් 04 දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2021 ඔක්තෝබර් 04 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2021 ඔක්තෝබර් 04 සඳුදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු මනූෂ නානායක්කාර මහතා, ගරු බුද්ධික පතිරණ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"ඉන්දිරා පිළිකා භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත සෞඛ්‍ය අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**11. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය" යි වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා. 12.01 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.25 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.02 ට ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ වූවාය. )

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.25 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය. )

(අ.භා. 4.17 ට කථානායකවරයා මූලාසනාරූඪ විය. )

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 4 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය**

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය" යි වෙළඳ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

**12. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග:** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වගන්තිය සමඟ කියවිය යුතු 22අ වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අගෝස්තු 19 දිනැති අංක 2241/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**13. කල් තැබීම (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් ශ්‍රී ලංකාව සම්බන්ධව අවධාරණය කළ කරුණු):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතු ය" යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරනලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය" යි කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.54 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවාය. )

එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබූයෙන් අද දින සභා සම්මතිය අනුව අ.භා. 5.39ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව 2021 ඔක්තෝබර් 04 සඳුදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.